ඇදහිල්ලේ ප්‍රකාශය

අප විශ්වාස කරනුයේ සියලු දේ මවන ලද එකම දෙව් පියාණන් පුත්‍රයාණන් සහ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළය.

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් බවත්, ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන කන්‍යාවක් වූ මරියාගේ කුස තුළ පිළිසිඳ ගෙන එතුමාණන් ඉපදුන බවත්, කුරුසපත්වී මරණයට පත්ව වළලනු ලැබූ පසු මළවුන්ගෙන් නැවත උත්ථානවී ස්වර්ගයට එසවුනු බවත්, දැන් පියවූ දෙවියන්වහන්සේගේ දකුණු පසින් වාඩි වී සිටින බවත්, සත්‍යවූ දෙවියන්වහන්සේත්, සත්‍යවූ මනුෂ්‍යා බවත්, අපි විශ්වාස කරන්නෙමු.

බයිබලය සම්පූර්ණ වශයෙන්ම දෙවියන්වහන්සේ කරණකොටගෙන ලියන ලද දේව වචනය බවත්, ඇදහිල්ලේ මග පෙන්වීමේ නොවරදින තීන්දුව බවත්, අපි විශ්වාස කරන්නෙමු.

මළවුන්ගේ නැගිටීම ගැනත්, ගැළවීම ලැබූ අයගේ සදාකාල ජීවනය සම්බන්ධවත්, ගැළවීම නොලබා නැතිවූ අයගේ සදාකාලික දඩුවම සම්බන්ධවත් අපි විශ්වාස කරන්නෙමු.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වගුරන ලද ලේ තුළින් ඇදහිලිවන්තයන්ගේ පෞද්ගලික ගැළවීම සම්බන්ධව අපි විශ්වාස කරන්නෙමු.

දෙවියන්වහන්සේ, වචනය සහ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් පවිත්‍ර කිරීම සම්බන්ධවත්, පෞද්ගලික ශුද්ධත්වය, හදවතේද ජීවිතයේද පිරිසිදු භාවය සම්බන්ධවත් අපි විශ්වාස කරන්නෙමු.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය කෙරෙහි ඇදහිල්ල තුළින් දිව්‍යමය සුවය තිබෙන බවත්, මිදීම තුළ සුවය අඩංගු වී ඇති බවත් අපි විශ්වාස කරන්නෙමු.

වතුර බව්තීස්මය, ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තීස්මය තුළින් පැහැදිලි වෙනසක් සිදුවූ නව උපත ගැනත් දෙවියන්වහන්සේගේ ආත්මයෙන් කථාකරන්ට පුළුවන්කම දෙන ප්‍රකාරයට අන්‍ය භාෂා වලින් කථා කිරීම (ක්‍රියා 2:4) ආත්මයාණන්-වහන්සේගේ දීමනා සහ ආත්මයාණන්වහන්සේගේ ඵල ගැන ඇති සාක්ෂිය ගැන අපි විශ්වාස කරන්නෙමු. මේ සියල්ලම ඇදහිලිවන්තයන්ට සතුවිය හැකි බවද අපි විශ්වාස කරන්නෙමු.

ආබ්‍රහම්ගේ ආශිර්වාද අපට ලැබෙන පිණිස යේසුස්වහන්සේ අප උදෙසා ශාපයක් වූ බව අපි විශ්වාස කරන්නෙමු.

පමා නොවී ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පෞද්ගලික නැවත පැමිණීම, කිතුණු භක්තිකයෙකුගේ බලාපොරොත්තුව බවත් අප විශ්වාස කරන්නෙමු.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත්, අදත්, සදාකාලයටත් එකාකාර බව අපි විශ්වාස කරන්නෙමු.

JESUS CHRIST IS LORD

à`÷{Ù<ùõ×ùµè&{þ$èæ´